## වියදම් ශීර්ෂය - 272 - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කුරුණෑගල

## කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ වන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ගිණුම් පිළිබඳ විගණකාධිපති වාර්තාව

### 1. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

(i). සංවර්ධන වැඩසටහන්, ව්‍යාපෘති හා ව්‍යවස්ථාපිත අණ පනත්වලින් පැවරී ඇති බලතල හා වගකීම් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල කටයුතු රජයේ නියමයන්ට අනුකූලව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණය හා මග පෙන්වීම.

(ii). දිස්ත්‍රික්කය තුළ නීතිය හා සාමය පවත්වාගෙන යාමටත් ජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීමටත් ආරක්ෂක අංශ සමඟ මනා සම්බන්ධතාවයක් පවත්වා ගැනීම.

(iii). වෙනත් රාජ්‍ය ආයතනවල නියෝජිතයෙකු ලෙස කටයුතු කිරීම සහ රාජ්‍ය ආදායම් එකතු කිරීමේ හා ගිණුම්ගත කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම.

### 2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල

| | |
|---|---|
| කුරුණෑගල | රිදීගම |
| පන්නල | මල්ලවපිටිය |
| වාරියපොල | මාස්පොත |
| ඉබ්බාගමුව | බිංගිරිය |
| ගනේවත්ත | නාරම්මල |
| මහව | පොල්පිතිගම |
| ගිරිබාව | ගල්ගමුව |
| අඹන්පොල | ඇහැටුවැව |
| පඬුවස්නුවර (බටහිර) | නිකවැරටිය |
| පඬුවස්නුවර (නැගෙනහිර) | කොබෙයිගනේ |
| කුලියාපිටිය (බටහිර) | රස්නායකපුර |
| කුලියාපිටිය (නැගෙනහිර) | කොටවෙහෙර |
| අලව්ව | වීරඹුගෙදර |
| මාවතගම | බමුණාකොටුව |
| පොල්ගහවෙල | උඩුබද්දාව |

### 3. වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම ගිණුම් වර්ෂයේ ආරම්භයේ පිළියෙල කර නොතිබුණි.

## 4. ගිණුම්

### 4.1 මුළු ප්‍රතිපාදනය හා වියදම

කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ඒ යටතේ වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30 ක් සලසා තිබුණු මුළු ප්‍රතිපාදනය රු.892,850,000 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසානය වන විට ඉන් රු.852,427,429 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ඉතිරිය රු.40,422,571 ක් වී තිබූ අතර, එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් 4.52% ක් විය. විස්තර පහත දැක්වේ.

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය | ශුද්ධ ප්‍රතිපාදනය | වියදම | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 839,450,000 | 839,450,000 | 801,862,689 | 37,587,311 | 4.47 |
| මූලධන | 53,400,000 | 53,400,000 | 50,564,740 | 2,835,260 | 5.3 |
| එකතුව | 892,850,000 | 892,850,000 | 852,427,429 | 40,422,571 | 4.52 |

### 4.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් ලැබී තිබුණු ප්‍රතිපාදන උපයෝජනය

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් පහත සඳහන් පරිදි රු.4,613,190,179 ක් ප්‍රතිපාදන ලැබී තිබුණ අතර, ඒවා උපයෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වැය ශීර්ෂය | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදන | තථ්‍ය වියදම | ඉතිරිය / අතිරික්තය (2010 දෙසැම්බර් 31 දිනට) |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| 101 | බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය | 600,000 | 598,720 | 1,280 |
| 103 | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය | 217,820 | 202,017 | 15,803 |
| 105 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 1,610,182,723 | 1,207,655,255 | 402,527,468 |
| 106 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 6,911,313 | 6,290,000 | 621,313 |
| 110 | අධිකරණ අමාත්‍යාංශය | 4,556,436 | 3,437,263 | 1,119,173 |
| 116 | සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය | 75,000 | 75,000 | 0 |
| 118 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 266,729 | 124,676 | 142,053 |
| 120 | ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය | 18,100,143 | 18,100,143 | 0 |
| 121 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 2,545,514 | 2,497,863 | 47,651 |

| | | | | |
|---|---|---|---|---|
| 124 | සමාජ සේවා අමාත්‍යාංශය | 10,327,355 | 10,019,292 | 308,063 |
| 127 | කම්කරු සබඳතා සහ ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය | 911,392 | 871,156 | 40,236 |
| 133 | තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | 14,926,023 | 12,265,275 | 2,660,748 |
| 134 | ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය | 211,505 | 208,697 | 2,808 |
| 139 | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 2,254,614 | 493,329 | 1,761,285 |
| 142 | ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 7,803,539 | 4,631,389 | 3,172,150 |
| 145 | නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය | 2,356,292 | 2,091,823 | 264,469 |
| 152 | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 1,056,101 | 958,521 | 97,580 |
| 153 | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | 52,507,305 | 51,982,180 | 525,125 |
| 156 | යෞවන කටයුතු අමාත්‍යාංශය | 696,270 | 558,088 | 138,182 |
| 160 | පරිසර අමාත්‍යාංශය | 10,343,000 | 1,760,595 | 8,582,405 |
| 201 | බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව | 34,813,623 | 31,999,644 | 2,813,979 |
| 203 | ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව | 65,000 | 65,000 | 0 |
| 206 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 9,500 | 9,500 | 0 |
| 210 | ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | 8,000 | 7,999 | 1 |
| 216 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 10,187,790 | 9,790,549 | 397,241 |
| 217 | පරිවාස හා ළමාරක්ෂණ සේවා දෙපාර්තමේන්තුව | 10,282,080 | 10,095,658 | 186,422 |
| 218 | සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | 1,011,979,273 | 996,974,470 | 15,004,803 |
| 219 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 2,770,588 | 121,500 | 2,649,088 |
| 226 | ආගමන හා විගමන දෙපාර්තමේන්තුව | 19,995 | 17,115 | 2,880 |
| 227 | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | 28,518 | 27,056 | 1,462 |
| 252 | ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | 4,622,298 | 3,582,944 | 1,039,354 |
| 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 1,357,912,365 | 1,274,539,349 | 83,373,016 |
| 254 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 849,602 | 547,130 | 302,472 |
| 282 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 430,165,505 | 386,489,880 | 43,675,625 |
| 286 | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | 11,100 | 6,750 | 4,350 |
| 307 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 765,868 | 599,722 | 166,146 |
| | නිදහස් තැපෑල | 1,850,000 | 1,850,000 | 0 |
| | එකතුව | 4,613,190,179 | 4,041,545,548 | 571,644,631 |

## 4.3 විගණනය හා විගණන විෂය පථය

කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ වාර්තාව 2011 සැප්තැම්බර් 14 දින කුරුණෑගල දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 4.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 4.5 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළිබඳ විගණන නිරීක්ෂණය

2010 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව, කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශවල තත්ත්වය මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණය 4.6 සිට 4.17 දක්වාවූ ඡේදවල ඇතුළත් වෙනත් ප්‍රධාන විගණන නිරීක්ෂණ හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය වේ.

### (අ) අයවැය විචලනය

ශීර්ෂ 272 යටතේ වැය විෂයයන් 09 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් 12% ත් 56% අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

### (ආ) පොදු තැන්පත් ගිණුම

(i). වර්ෂ 2 කට වැඩි රු.32,954,768 ක් වූ තැන්පත් ශේෂ 406 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii). වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් විවිධ කාර්යයන් සඳහා ලබා දී තිබුණු රු.6,596,167 ක මුදල් අදාල කාර්යයන්ට නොයොදා තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(iii). රිදීගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2008 සහ 2009 වර්ෂවල ගම නැගුම ව්‍යාපෘතිවල පෙන්වා දී ඇති අඩුපාඩු නිරාකරණය නොකිරීම නිසා වසම් 06 ක රු.189,974 ක් හා ව්‍යාපෘති 29 කට අදාල රු.536,262 ක රැඳවුම් මුදල් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳසැසඳුම් ප්‍රකාශය**

(i). විෂය අංක 27201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශයේ 2010 දෙසැම්බර් 31 දින වන විට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.2,813,100 ක් වූ අතර, එම හිඟ සිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii). දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ණය ගෙවීමේදී පිළිපැදිය යුතු රෙගුලාසිවල විධිවිධාන අනුගමනය නොකර රු.539,260 ක ණය ගෙවා තිබුණි.

(iii). දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කේවල ගිණුම් ශේෂ හා පාලන ගිණුමේ ශේෂය අතර, රු.32,175 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 4.6 වත්කම් කළමනාකරණය

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත විග්‍රහ කර ඇති පරිදි සමහරක් වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය | අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
|---|---|---|---|
| | | අවුරුදු | |
| (i). ගොඩනැගිලි | 01 | 02 | මාවතගම |
| | 01 | 01 | ඉබ්බාගමුව |
| | 01 | 05 | අලව්ව |
| (ii). වාහන | 01 | 01 | රිදීගම |
| (iii). යන්ත්‍ර සූත්‍ර | 02 | 01 | ගනේවත්ත |

(iv). ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙ පිහිටි අක්කර 70 ක් විශාල රජයේ ඉඩම ගොවිජන සමාගමකට දීර්ඝකාලීන පදනම මත බදු දී තිබුණද, එය උපරිම ඵලදායීතාවය ලැබෙන පරිදි එම සමාගම විසින් යොදවාගෙන නොතිබුණි.

**(ආ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්වපරිහරණය කිරීම**

වයඹ පළාත් සභාවසතු පහත වත්කම් කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් භාවිතයට ගෙන තිබූ අවස්ථාවන නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වත්කම් වර්ගය | වත්කම් අයත්ව තිබුණු ආයතනය | සංඛ්‍යාව ඒකක ගණන හෝ ප්‍රමාණය | වටිනාකම | කාල පරිච්ජේදය |
|---|---|---|---|---|
| | | | රු. | |
| වාහන | වයඹ පළාත් සභාව | 06 | - | 1989 සිට |
| කම්හල් හා කාර්යාලීය උපකරණ | ආසියානුසංවර්ධන බැංකු ව්‍යාපෘතිය | - | 200,000 | 1983 සිට |

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2010 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ, වර්ෂ 01 ට අඩු බැරකම් රු.83,708 ක් විය.

**4.7 අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(i) ව්‍යවස්ථාපිත විධිවිධාන** | | |
| ඉඩම් ආඥා පනතේ 8(1) (2) 10, 17 (1), 86(1) වගන්ති | 304,000 | බදු හා වාර මුදල් නොගෙවීම හේතුවෙන් ඉඩම් ආපසු පවරා ගැනීමට කටයුතු නොකිරීම |
| **(ii) ආයතන සංග්‍රහය** | | |
| xii වැනි පරිච්ඡේදයේ 8.2.1 වගන්තිය | - | සහකාර ප්‍රාදේශීය ලේකම්වරයක් වැටුප් සහිත දින 41 ක විදේශ නිවාඩු වැඩිපුර ලබාගැනීම. |
| **(iii) මුදල් රෙගුලාසි** | | |
| (අ) මුදල් රෙගුලාසි 104 | 158,400 | මාස්පොත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අංක 52-6196 වාහනය හදිසි අනතුරකට ලක්වීමෙන් වූ අලාභය පිළිබඳව පාඩු හා හානි වාර්තා පිළියෙල නොකිරීම. |
| (ආ) මුදල් රෙගුලාසි 137,138,139 | 1,310,125 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක සමාලෝචිත වර්ෂයේදී නිකුත් කරන ලද චෙක්පත් 28 ක් 2010 දෙසැම්බර් 31 දින වන විටත් අත රඳවාගෙන තිබීම. |
| **(iv) චක්‍රලේඛ විධිවිධාන** | | |
| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | |
| (අ) 2007 මැයි 29 දිනැති ජාතික සවිය - ගම නැගුම උපදෙස් අංක 05 හි 2 (iv) ඡේදය | 58,402,749 | කොන්ත්‍රාත්කරුවන්ට වැඩිපුර ගෙවීම |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2009 මාර්තු 24 දිනැති අංක 2008/13(ii) දරන චක්‍රලේඛය | 138,253 | (i). ප්‍රාදේශීය ලේකම්වරු දෙදෙනෙකු වෙත නියමිත සීමාව ඉක්මවා ඉන්ධන ලබාදී තිබීම. |
| | | 43,793 | (ii). පඩුවස්නුවර (නැගෙනහිර) ප්‍රාදේශීය ලේකම්වරයා 2010 වර්ෂයේ මුල් මාස අට තුළ පමණක් නියමිත සීමාව ඉක්මවා ඉන්ධන ලීටර් 585 ක් පාවිච්චි කර තිබීම. |
| (ඇ) | 2010 නොවැම්බර් 22 දිනැති අංක ස්වක/මු/1/ගිපි/2010 දරන චක්‍රලේඛ ලිපිය | 50,696 | මහව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් 06 දෙනෙකුට නිවාඩු දින වැටුප් වැඩිපුර ගෙවීම. |

## 4.8 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

### (අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ නොකර තිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ යුතු වූ දිනය | ආරම්භ නොකිරීමට හේතු කෙටියෙන් |
|---|---|---|---|
| | රු. | | |
| ජාතික සවිය ගම නැඟුම විමධ්‍යගත හා වෙනත් දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ වූ ව්‍යාපෘතීන් 282 ක් | 131,825,004 | 2010 මාර්තු සිට දෙසැම්බර් දක්වා | i. කාලගුණික හේතු<br>ii. කාලවේලා හා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම |

### (ආ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාල යටතේ වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භකර තිබුණත්, එම ව්‍යාපෘති නිම නොකර අත්හැර දමා තිබුණි.

| | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | 2010 දෙසැම්බර් 31 දින වන විට වියදම | අතහැර දැමීමට හේත |
|---|---|---|---|---|---|
| | | රු. | | රු. | |
| කුලියාපිටිය (නැගෙනහිර) | මහගම ප්‍රජා ශාලාව මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 449,252 | 2010.11.18 | 338,260 | බිල්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම |

**(ඈ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 ක් විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිම කළ යුතු දිනය | 2010 දෙසැම්බර් 31 දින වන විට වියදම | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|---|
| | රු. | | | රු. | |
| ජාතික සවිය - ගම නැගුම විමධ්‍යගත අයවැය හා වෙනත් ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති 58 ක් | 304,957,289 | 2010 දෙසැම්බර් මාසය | 2010.12.31 | 48,485,282 | ව්‍යාපෘති අනුමත වීම ප්‍රමාද වීම අමුද්‍රව්‍ය හිඟය හා කාලගුණික හේතු |

**(ඇ) මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

(i). 2009-2010 ජාතික සවිය - ගම නැගුම සංවර්ධන වැඩසටහන යටතේ විදුලි ව්‍යාපෘති 10 ක් සඳහා ඇස්තමේන්තුගත වියදම රු.5,232,790 ක් රිදීගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විදුලි බල මණ්ඩලයට ගෙවා තිබුණද, 2010 දෙසැම්බර් 15 වන විටත් ඉදිකිරීම් සිදුකර නොතිබුණි.

(ii). ජාතික සවිය - ගම නැගුම යටතේ පඬුවස්නුවර (නැගෙනහිර) දහම් පාසැල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2007 වර්ෂයේ රු.99,999 ක් ලැබී තිබූ අතර, එම ගොඩනැගිල්ල ඉදිකිරීම 2010 දෙසැම්බර් 31 වන විටත් සිදුකර නොතිබුණි.

**(ඉ) කාල පමාවකින් පසුවවැඩ ආරම්භ කළ ව්‍යාපෘති**

ජාතික සවිය - ගම නැගුම යටතේ පහත දැක්වෙන කර්මාන්ත ඉටුකිරීමට ප්‍රතිපාදන මුදාහැර තිබුණද, ඒවායේ වැඩ ආරම්භ කිරීම 2010 දෙසැම්බර් දක්වා ප්‍රමාද කර තිබුණි.

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | කර්මාන්තය | මුදාහැර ඇති මුදල | ආරම්භ කළ යුතු දිනය | ප්‍රමාද කාලය |
|---|---|---|---|---|
| | | රු. | | |
| ගනේවත්ත | මාර්ග 06 ක් කොන්ක්‍රීට් කිරීම බෝක්කු 02 ක් ඉදිකිරීම | 5,202,026 | 2010 ඔක්තෝබර් | මාස 03 |
| රිදීගම | මාර්ග 02 ක් කොන්ක්‍රීට් කිරීම | 300,000 | | |

**(ඊ) භාණ්ඩ හා සේවා සැපයීම රහිතව මුදල් නිදහස් කිරීම**

මහව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2010 දෙසැම්බර් 31 දින රු.485,500 ක් වැයකර පරිගණක 09 ක් මිලදී ගෙන මහවසංස්කෘතික මධ්‍යස්ථානයේ ස්ථානභාර නිලධාරී වෙත 2011 ජනවාරි 12 දින නිකුත් කර තිබුණද, 2011 පෙබරවාරි 03 දින කළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී එම සංස්කෘතික මධ්‍යස්ථානයේ පරිගණක ඒකකයක් නොමැති බවත්, එකී පරිගණක එයට ලැබී නැති බවත් අනාවරණය විය.

## 4.9 කාර්ය සාධනය

2010 වාර්ෂික ඇස්තමේන්තු / ක්‍රියාකාර සැලැස්මට අනුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ වන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක ප්‍රධාන කාර්යයන් කොහෙත්ම ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i). අලව්ව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විමධ්‍යගත අයවැය යටතේ කැප්පිටිවලාන මහයාය මාර්ගය බොරළු දැමීම සඳහා රු.149,816 ක් වියදමක් දරා තිබුණ අතර, 2011 පෙබරවාරි 23 දින සිදුකළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී මාර්ග තලය සඳහා බොරළු ඇතිරීම සිදු නොකර පස් අතුරා ඒ මත බොරළු සුළු ප්‍රමාණයක් ඇතිරීම පමණක් සිදුකර තිබුණි.

(ii). රස්නායකපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2007-2010 දක්වා ජාතික සවිය - ගම නැගුම යටතේ ඉටුකරන ලද මාර්ග කොන්ක්‍රීට් කිරීම්, ව්‍යාපෘති 06 ක ගල් ගැලවී තිබීම, නියමිත දුර ප්‍රමාණයන් ඉටු නොකිරීම, ප්‍රමාණවත් ප්‍රතිලාභීන් පිරිසක් ආවරණය නොවීම හා නියමිත පරිදි බොරළු පුරවා නොතිබීම් දක්නට ලැබුණි.

(iii). පඬුවස්නුවර (නැගෙනහිර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජාතික සවිය - ගම නැගුම යටතේ කොන්ක්‍රීට් කර තිබූ මාර්ග 04 ක නියමිත ඝනකමට කොන්ක්‍රීට් නොයෙදීම, කොන්ක්‍රීට් ගැලවීම හා මාර්ග තලයේ ගල් මතුවීම සිදුවී ඇති බවස්ථානීය පරීක්ෂාවේදී අනාවරණය විය.

(iv). ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘතියකින් 1993 නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් වෙත ලැබී තිබූ රු.200,000 ක් වූ කම්හල් හා කාර්යාලීය උපකරණ 2010 දෙසැම්බර් 31 වන විටද භාවිතා කර නොතිබුණි.

## 4.10 බැංකු ගණම් මෙහෙයවීමේ අඩුපාඩු

### (අ) අක්‍රීය බැංකු ගිණුම්

ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලැබූ බැංකු ගිණුමක් 2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 12 මාස 03 ක් අක්‍රීයව තිබුණු අතර, අක්‍රීයව පැවති මුදල රු.20,322 ක් විය.

### (ආ) ගැලැපුම් කළ යුතු ශේෂ

2010 දෙසැම්බර් මාසය සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් විසින් පිළියෙල කර තිබූ බැංකු ප්‍රකාශනවල දැක්වුණු ගැලැපුම් පිළිබඳ විග්‍රහයට අනුව මාස 06 සිට වර්ෂ 01 දක්වා කාල පරාසයක වූ නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් වටිනාකම රු.13,208 ක් විය.

## 4.11 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කොන්ත්‍රාත්තුවක වැඩ විෂයයන් 12 ක් නිමකර නොතිබියදී සියලුම වැඩ විෂයයන් නිමකළ බව දන්වා රු.192,300 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

## 4.12 අවිධිමත් ගනුදෙනු

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක් විසින් එළඹ තිබුණු සමහරක් ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම්

පහත අවස්ථා නිරීක්ෂණය විය.

(අ) පඩුවස්නුවර (නැගෙනහිර), ඉබ්බාගමුව, අලව්ව, නිකවැරටිය, රිදීගම, කුරුණෑගල, මාස්පොත, මලලවපිටිය, නාරම්මල, උඩුබද්දාව, පොල්ගහවෙල, කොටවෙහෙර හා පඩුවස්නුවර (බටහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ක්‍රියාත්මක කර තිබූ ජාතික සවිය - ගම නැගුම ව්‍යාපෘතිවලදී, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 හි 3.9.1 හා 3.9.2 ඡේදවල දක්වා ඇති විධිවිධානයන්ගෙන් බැහැරව කටයුතු කර තිබුණි.

(ආ) විධිමත් බදු ගිවිසුමකින් තොරව රිදීගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2008 දෙසැම්බර් 18 සිට වසරකට රු.240,000 බැගින් වූ බිම් කුලියක් මත රජයට අයත් භූමි කොටසක සන්නිවේදන කුළුණක් ඉදිකිරීම හා එයට අවශ්‍ය කටයුතු සඳහා පරිහරණය කිරීම සඳහා ව්‍යාපාරික සමාගමකට බදු දී තිබුණි.

## 4.13 පාඩු හා හානි

කුලියාපිටිය (නැගෙනහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංචිත වාහනය 2002 මාර්තු 29 දින අනතුරට භාජනය වීමෙන් වූ රු.119,641 ක සහ කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අංක 54-7730 වාහනයට සිදුව තිබූ රු.39,100 ක අලාභයන් අයකර ගැනීමට නොහැකිව තිබුණි.

## 4.14 අනාර්ථික ගනුදෙනු

පඩුවස්නුවර (බටහිර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අඹගහවැව මැටි වලං නිෂ්පාදන ව්‍යාපෘතියේ ජල සංරචකය ඉදිකිරීම සඳහා රු.197,000 ක අත්තිකාරමක් ගෙවා තිබූ අතර, 2010 ජූනි අවසානය වන විට එය නිමකර තිබුණද, එම ඉඩමෙහි පවතින ආරවුල් සහගත තත්ත්වය මත ප්‍රයෝජනයට ගත නොහැකිව තිබුණි. එසේම 2007 දී රු.650,000 ක් වැයකර ස්ථාපනය කර තිබූ මැටි අඹරණ යන්ත්‍රයද ක්‍රියාත්මක කිරීමකින් තොරව ඇති බව 2010 ඔක්තෝබර් මාසයේදී සිදුකරන ලද ස්ථානීය පරීක්ෂාවේදී අනාවරණය විය.

## 4.15 මෙහෙයුම් ආකර්යක්ෂමතා

නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ මෙහෙයුම් අකාර්යක්ෂමතා සම්බන්ධ සාරාංශයක් පහත දැක්වේ.

(අ) අලව්වසහ පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි 2010 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල ඇතුළත් නොමැති අබලි ද්‍රව්‍ය හා අපහරණයට නිර්දේශිත භාණ්ඩ විශාල ප්‍රමාණයක් එම ප්‍රාදේශීය ලේකම් නිල නිවාසවල ගොඩ ගසා තිබුණි.

(ආ) ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වෙල්ගාල ග්‍රාම නිලධාරී වසම ආදර්ශ ගම්මානයක් වශයෙන් 2008 වර්ෂය තුළදී සංවර්ධනය කිරීමට ව්‍යාපෘති 09 ක් නිම කළ යුතු වුවද, නිම කර තිබුණේ ව්‍යාපෘති 05 ක් පමණකි. වෙල්ගාල නැණසල හා ග්‍රාම ලේකම් කාර්යාලය ඉදිකිරීම සඳහා 2009 දෙසැම්බර් 31 වන විට රු.2,845,586 ක වියදමක් දරා I හා II අදියර පමණක් නිමකර තිබුණි. රු.1,705,835 ක වියදමක් දරා ඉදිකරන ලද ක්‍රීඩා පිට්ටනියද අභාවිතව පැවති අතර, රු.1,693,843 ක් වියදමක් දරා යුනිට් 03 ප්‍රජා ශාලාවේ බිම් මහල ඉදිකර තිබුණද, එහි ඉදිකිරීම් සම්පූර්ණ කර නොතිබුණි.

(ඇ) පඬුවස්නුවර (නැගෙනහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ජාතික සවිය - ගම නැගුම යටතේ 2009 වර්ෂයේ වැවක් ප්‍රතිසංස්කරණය කිරීමේදී සිදුව ඇති අක්‍රමිකතා පිළිබඳව මහජන පැමිණිලි පරීක්ෂා කර කඩිනමින් වාර්තාවක් ලබා දෙන ලෙස උපදෙස් දී දිස්ත්‍රික් ලේකම් විසින් 2010 ඔක්තෝබර් 14 දින ත්‍රිපුද්ගල පරීක්ෂණ මණ්ඩලයක් පත්කර තිබුණද, 2011 මාර්තු 15 දින වන විටත් පරීක්ෂණයක් කළ බවට සාක්ෂි ඉදිරිපත් නොවීය.

(ඈ) මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2007 සිට 2010 දක්වා ජාතික සවිය ගම නැඟුම සංවර්ධන වැඩසටහන යටතේ මාර්ග කොන්ක්‍රීට්ව්‍යාපෘති 12 ක් සම්බන්ධයෙන් කරනු ලැබූ භෞතික පරීක්ෂාවේදී ව්‍යාපෘති 06 ක මාර්ග තලයේ ගල් ගැලවී යාම, පුපුරා ගිලා බැස තිබීම, පැති බැම්වල බදාම ගැලවී යාම, ප්‍රසාරණ මූට්ටු නියමාකාරයෙන් නොතැබීම හා දෙපස පස් පුරවා නොතිබීම සිදුව තිබුණි.

(ඉ) රිදීගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත ග්‍රාම නිලධාරීවරයෙකුගේ අධ්‍යාපන සුදුසුකම් ඔහුගේ පරිවාස කාලය තුළ සනාථ කර නොගැනීම නිසා පත්වීම් දින සිට වසර 10 ක් සේවයේ යොදවාගෙන වැටුප් ගෙවා තිබුණි.

(ඊ) දීර්ඝ කාලීන බදු යටතේ දී තිබූ ඉඩමක බදුකාර සමාගමක් විසින් පොල්ගස් 65 ක් කපා විකුණා තිබූ අතර, බදුකරු විසින් කරනු ලැබූ බරපතල විෂමාචාරය සම්බන්ධයෙන් ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් විසින් බදු ගිවිසුම ප්‍රකාර විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(උ) කළුගල් කැඩීමේ බලපත්‍ර ලාභීන් 05 දෙනෙකුගෙන් රු.36,500 ක හිඟ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කුලියාපිටිය (නැගෙනහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ක්‍රියාකර නොතිබුණි.

(ඌ) ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රජයේ ඉඩමක් දිගු කාලීනව බදු දීම මත 1999 සිට 2007 දක්වා ගිවිසුම් ප්‍රකාරව අයවිය යුතු දඩ රු.547,000 ක් හා 2008 සිට 2010 දක්වා බදු මුදල් රු.695,312 ක් වශයෙන් එකතුව රු.1,242,312 ක් අයකර ගෙන නොතිබුණි.

## 4.16 මානවසම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු**

2010 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තතත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i). ජ්‍යෙෂ්ඨ මට්ටම | 160 | 138 | 22 |
| (ii). ද්විතික මට්ටම | 2621 | 2506 | 115 |
| (iii). ප්‍රාථමික මට්ටම | 297 | 257 | 40 |
| එකතුව | 3078 | 2901 | 177 |

## 4.17 අභ්‍යන්තර පාලනය

### (අ) අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන ඒකකය මගින් දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ගෙවීම් වවුචර් පරීක්ෂා කර වාර්තා නිකුත් කිරීම සිදු කළද, අභ්‍යන්තර විගණන සැලැස්මකන් තොරව කටයුතු කිරීම නිසා මුදල් රෙගුලාසි 133 හි දක්වා ඇති මූලික පරමාර්ථ ඉටු වී නොතිබුණි.

### (ආ) කළමනාකරණ හා විගණන කමිටු ක්‍රියාත්මක කිරීම

2000 මාර්තු 15 දිනැති අංක පීඑෆ්/පීර්/07 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 2006 අගෝස්තු 28 දිනැති අංක පීඑෆ්/එෆ්එස්/04(xiii) දරන භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛයෙන් දී ඇති උපදෙස්වලට අනුව විගණන කළමනාකරණ කමිටු පිහිටුවීමට 2010 දෙසැම්බර් අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි.